
සෑම ළමයකු සඳහාම

# අපරාධ යුක්ති ක්‍රියාවලිය තුළ ළමුන්ට නෛතික ආරක්ෂාව සැලසීම




පරිවාස නිලධාරීන්, ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්, පොලිස් නිලධාරීන්, කම්කරු නිලධාරීන්, බන්ධනාගාර නිලධාරීන් සහ අපරාධ යුක්ති ක්‍රියාවලිය හා සම්බන්ධ ළමුන් පිළිබඳව ක්‍රියා කරන වෙනත් රාජ්‍ය නිලධාරීන්ගේ ප්‍රයෝජනය උදෙසා එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලේ (යුනිසෙෆ්) ශ්‍රී ලංකාවෙහි ළමා රැකවරණ ආයතනයේ සහ මානව හිමිකම් හා සංවර්ධනය පිළිබඳ නීතිවේදීන්ගේ සංවිධානයේ සහයෝගය ඇතිව අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයවිසින් සකසන ලද අත්පොත.

unicef

සෑම ළමයකු සඳහාම

# මේ කුඩා පුස්තකය

- 1939 ළමා හා යෞවන ආඥා පනත සඳහා පහසු අත්වැලක් (පිටුව 3) සහ
- ළමා හා යෞවන ආඥා පනත යටතේ දී ඇති නඩු තීන්දු (පිටුව 10) ඔබ වෙත ඉදිරිපත් කරයි

## පෙර වදන

ළමා හා යෞවන ආඥා පනත 1939 වසරේ පනවන ලද්දක් වුවද එය බල පවත්වන ලද්දේ 1950 වසර වල මුල් අවධියේදීය. වරප්‍රසාද අහිමි සහ බාල අපරාධ කළ ළමයින් හා යෞවනයින් පිළිබඳව කටයුතු කිරීමට අවශ්‍ය නෛතික ක්‍රියා පටිපාටි ළමා හා යෞවන ආඥා පනත මගින් පනවා ඇත. පසුගිය කාලය තුළදී රජය මෙම ළමුන් හට සැලකූ ආකාරය මෙම ආඥා පනතේ ප්‍රතිපත්ති හා ව්‍යවහාර අනුව සකස් වී තිබේ. ළමා හා යෞවන ආඥා පනත මූලික වශයෙන් පොලිස් නිලධාරීන් පරිවාස හා ළමාරක්ෂක නිලධාරීන් සහ මහෙස්ත්‍රාත් අධිකරණ මගින් ක්‍රියාත්මක කෙරේ.

මෙම සේවා තුන අතුරින් පරිවාස හා ළමාරක්ෂක නිලධාරීන් ළමා සුබ සාධනය පිළිබඳ භාරකරුවන් ලෙස නිරවුල්ව හඳුනා ගත හැකිය. ආඥා පනතේ 21 වන වගන්තියේ ගැබ්වී ඇති මෙම සුබ සාධන ප්‍රතිපත්තිය වර්ෂ 2007 අංක 56 දරණ පනතේ 5(2) වගන්තියෙහි සඳහන් ළමයාගේ උපරිම යහපත පිළිබඳ ප්‍රතිපත්තියට අනුකූලව කියවිය යුතු වේ.

පරිවාස හා ළමා ආරක්ෂක දෙපාර්තමේන්තුව 1956 දී පිහිටුවා ඇත. එහි 50වන සංවත්සරය මෑතකදී සමරණ ලදී. මෙම කාලය තුළ අප රට තුළ විවිධ හේතු මත අසරණ වූ ළමුන් පිළිබඳව ඉතා පුළුල් බලතල, කාර්ය සහ යුතුකම් එහි නිලධාරීන්ට පවරා ඇති මුත් මෙම නීතිය සිංහල හෝ දෙමළ භාෂා පරිවර්තන ලෙස ලබා ගැනීමේ පහසුකම් ඔවුනට නොතිබිණි. මෙම කුඩා පුස්තකය නව ප්‍රවේශයක් යොදා ගනිමින් ළමා හා යෞවන ආඥා පනතේ ප්‍රතිපාදන පරිවාස හා ළමාරක්ෂක නිලධාරීන්ට සහ වෙනත් රජයේ නිලධාරීන්ට හුරුකිරීමේ අවශ්‍යතාව සපුරාලීමට කටයුතු කර තිබේ. ආඥා පනතේ ගැබ්වී ඇති අත්‍යවශ්‍ය හා මූලික ප්‍රතිපත්ති හා ප්‍රතිපාදන නිසිලෙස හඳුනාගෙන ඒවා උපරිම නිලධාරී සංඛ්‍යාවකට හා සාමාන්‍ය ජන කොටසකට අවබෝධ කරවීම උදෙසා මෙම නීතියට අනුව දුන් නඩු තීන්දුද මෙහි ඇතුළත් කර තිබේ.

මෙම කුඩා පුස්තකය ආඥා පනත හඳුනා ගැනීම සඳහා යොදාගත හැකි අත්පොතක් ලෙස භාවිතා කළ යුතු වේ. ඒ හරහා බොහෝ නිලධාරීන්ට මෙම නීතියේ අන්තර්ගතය අවබෝධකර ගැනීමටත් එහි භාවිතය වැඩිදියුණු කර ගැනීමටත් උනන්දු කරවන අතර එය සජීවී නීතියක් බවට පත්කරවනු ඇතැයි මම අපේක්ෂා කරමි. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියට අදාල වන අයුරින් ආඥා පනතේ සමහර පැතිකඩ ප්‍රතිසංස්කරණය කිරීමට අදහස් කරන අවධියක එය සාර්ථක කර ගැනීම සහතික කළ හැක්කේ ආඥා පනත පිළිබඳව කෙරෙන ඉහත ආකාරයේ උත්සාහයකින් පමණි.

මෙම ප්‍රකාශනය යථාර්ථයක් කර ගැනීමට අප හා එක්ව කටයුතු කරන ශ්‍රී ලංකාවේ යුනිසෙෆ් ආයතනය සහ සේව් ද චිල්ඩ්‍රන් සංවිධානයට මම අතිශයින් කෘතඥ වෙමි.

සුහද ගම්ලත්
ලේකම්, අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
2008 සැප්තැම්බර් 1

# 1939 ළමා හා යෞවන ආඥා පනත

පිළිබඳව ඔබ දැනගත යුතු දේ

ළමා උසාවි

පොදු මූලධර්ම

බාලක යුක්තිය

භාරය හා ආරක්ෂාව

# ළමා උසාවිය

## ළමා උසාවිය යනු කුමක්ද?

ළමා හා යෞවන ආඥා පනත යටතේ අපරාධ චෝදනාවක් හෝ භාරය හා ආරක්ෂාව පිළිබඳ නඩුවක් විමසන ඕනෑම මහේස්ත්‍රාත් උසාවියක් **ළමා උසාවියක්** වේ.

## ළමා උසාවියක ප්‍රධාන කාර්යපටිපාටි මොනවාද?

ළමයකු හෝ යෞවනයකු සම්බන්ධයෙන් ළමා උසාවියක අනුගමනය කළ යුතු කාර්යපටිපාටි **දෙකක්** තිබේ. එනම්,

1. *බාලක යුක්තිය පසිඳලීමේ කාර්යපටිපාටිය*

   මිනී මැරීම, සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය, මිනී මැරීමට තැත් කිරීම, සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය කිරීමට තැත් කිරීම සහ දණ්ඩ නීති සංග්‍රහයේ 383 වගන්තිය යටතට ගැනෙන ආයුධ සන්නද්ධව කෙරෙන මංකොල්ලකෑම් යන අපරාධ හැර ළමයකු හෝ යෞවනයකු විසින් සිදු කරනු ලබන ඕනෑම අපරාධයක් පිළිබඳ නඩු විභාග කිරීම.

2. *ළමයකුගේ භාරය හා ආරක්ෂාව අදාළ කාර්යපටිපාටිය*

   භාරය හා ආරක්ෂාව අවශ්‍ය ළමයකු හෝ යෞවනයකු පිළිබඳ නඩුවක් අසා පවුල තුළ හෝ පවුලෙන් පිට ස්ථානයක ළමයාට අවශ්‍ය ආරක්ෂාව සලසමින් සුදුසු නියෝගයක් කිරීම.

## ළමයෙක් යනු කවරෙක්ද?

වයස අවුරුදු 14ට අඩු පුද්ගලයෙකි.
**88 වන වගන්තිය**

## යෞවනයෙක් යනු කවරෙක්ද?

වයස අවුරුදු 14ට වැඩි සහ 16ට අඩු පුද්ගලයෙකි.
**88 වන වගන්තිය**

## රහස්‍යභාවය රැකීම

ළමා උසාවියක නඩු කටයුතු පිළිබඳ කිසිදු වාර්තාවක් පළ කළ නොහැක. ළමා උසාවියක් හමුවට එන ළමයකු හෝ යෞවනයකු හඳුනාගැනීමට උපකාරී වන කිසිවක් ජනමාධ්‍ය මඟින් ප්‍රසිද්ධ කළ නොහැක.
**11 හා 20 වගන්ති**

අපරාධ නඩුවක් විභාග කරන විට ළමයකු හෝ යෞවනයකු අධිකරණය තුළ රැඳී සිටීම යෝග්‍ය නොවේ. ළමයකු හෝ යෞවනයකු පුද්ගලික හෝ සදාචාරයට එරෙහි කරුණක් පිළිබඳව සාක්ෂි දෙන විට නඩුවට සම්බන්ධයක් නැති පුද්ගලයින් අධිකරණ ශාලාවෙන් ඉවත් කළ හැක.
**18 සහ 19 වන වගන්ති**

## ළමා හා යෞවන ආඥා පනතේ ක්‍රියාකාරිත්වය

ළමා හා යෞවන ආඥාපනතේ ෂෂ වන කොටසේ 13-47 දක්වා වගන්ති ළමයින් හා යෞවනයන් සම්බන්ධ සියලුම අපරාධ නඩුවලට අදාල වේ. දණ්ඩ නීති සංග්‍රහයේ හා අපරාධ නඩු විධාන සංග්‍රහයේ ප්‍රතිපාදන ආඥාපනතට පටහැනි නොවන අවස්ථාවලදී අඩුපාඩු සපුරා ගැනීම සඳහා අදාල කරගත හැක.
**47 වගන්තිය**

# පොදු මූලධර්ම

- ## සුබසාධන මූලධර්මය

ළමා උසාවිය සෑම අවස්ථාවකදීම ළමයාගේ හෝ යෞවනයාගේ සුබ සාධනය පිළිබඳව සැළකිලිමත් විය යුතුය.
**21 වගන්තිය**

- ## වැඩිහිටි වරදකරුවන් ගෙන් වෙන් කොට තැබීම

සෑම අවස්ථාවකදීම ළමයින් වැඩිහිටි වරදකරුවන් ගෙන් වෙන්කොට තැබිය යුතු අතර බාලිකාවන් කාන්තා නිලධාරිනියකගේ භාරයේ තැබිය යුතුය.
**13 වගන්තිය**

- ## දෙමාපියන් හෝ භාරකරු උසාවියට කැඳවීම

සෑම නඩු කටයුත්තකදීම උසාවියට පැමිණෙන ලෙස ළමයාගේ හෝ යෞවනයාගේ දෙමාපියන්ට හෝ භාරකරුට නියම කළ යුතුය.
**16 (1) වගන්තිය**

- ## පොලිස් නිලධාරීන් විසින් පරිවාස නිලධාරී වෙත දැනුම් දීම හා සමාජ වාර්තාව ඉදිරිපත් කිරීම

පොලිස් නිලධාරියකු විසින් කවර හෝ හේතුවක් මත ළමයකු හෝ යෞවනයකු උසාවියට ගෙනඒමට පෙර වහාම අදාල පරිවාස නිලධාරී වෙත දැනුම් දිය යුතුය.

පරිවාස නිලධාරියා ළමයාගේ සමාජ හා පවුල් පසුබිම විමර්ශනය කොට උසාවියට වාර්තා කළ යුතුය.
**17 (1) හා (2) වගන්ති**

- ## පරිවාස නිලධාරීන්ගේ හා සුදුසු පුද්ගලයින්ගේ අධීක්ෂණ කටයුතු

උසාවිය ළමයා පරිවාස නිලධාරියකුගේ අධීක්ෂණය යටතේ හෝ සුදුසු පුද්ගලයකුගේ භාරය යටතේ තැබීමට තීරණය කළ හොත්,

(අ) නියමිත කාලයකට වරක් නිතිපතා ළමයා හමුවී වාර්තා ලබා ගැනීමත්

(ආ) ළමයාට අධිකරණය මගින් පනවා ඇති කොන්දේසි පිළිපදින්නේ දැයි විමසා බැලීමත්

(ඇ) ළමයාගේ හැසිරීම (කල් ක්‍රියාව) පිළිබඳව අධිකරණයට වාර්තා කිරීමත්

(ඈ) ළමයාට අවශ්‍ය උපදෙස් හා උදව් උපකාර ලබාදීමත්, අවශ්‍ය අවස්ථාවන්හීදී ඔහුට හෝ ඇයට සුදුසු රැකියාවක් සොයා දීමත් ඔවුන්ගේ වගකීම වේ
**38 (1) වගන්තිය**

# බාලක යුක්තිය

## ■ පොලිස් ඇප

ළමයකු හෝ යෞවනයකු අත්අඩංගුවට ගත් විට, ඔහුගේ හෝ ඇයගේ දෙමාපියන් හෝ භාරකරු කැඳවා ළමයා පොලිස් ඇප මත නිදහස් කළ යුතුය.

14 (1) වගන්තිය

## ■ පොලිස් ස්ථානාධිපතිගේ අභිමතය

සිදුකර ඇති අපරාධය මිනී මැරීමක්, සාවද්‍ය මනුෂ්‍ය ඝාතනයක්, මිනී මැරීමට තැත් කිරීමක් හෝ, සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය කිරීමට තැත් කිරීමක් හෝ දණ්ඩ නීති සංග්‍රහයේ 383 වගන්තිය යටතට ගැනෙන සන්නද්ධ මංකොල්ලයක් නම් හා පොලිස් ඇප මත මුදා හැරීම සුදුසු නොවන්නේ යැයි ඔහුගේ මතය වන්නේ නම්, ළමයා හෝ යෞවනයා අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට මත්තෙන් පනතේ 14 (3) වගන්තිය යටතේ නම් කොට ඇති රැඳවුම් නිවාසයක හෝ ස්වේච්ඡා රැඳවුම් නිවාසයක තැබීමට පොලිස් ස්ථානාධිපතිවරයාට හැකිය.

14 (3) වගන්තිය

## ■ ඇප ලබාගැනීමේ අයිතිය

සිදුකර ඇති වරද ඇප දිය හැකි වරදක්[1] නම්, ඇප ලැබීම ළමයාගේ හෝ යෞවනයාගේ අයිතියක් වශයෙන් සලකා ඔහු ඇප මත මුදා හළ යුතුය. අනෙක් වැරදි සම්බන්ධයෙන්, ඔහු රැඳවුම් නිවාසයක හෝ සුදුසු පුද්ගලයකුගේ භාරය යටතේ තැබිය හැකිය.

15 (1) වගන්තිය

## ■ ළමයකු රක්ෂණ බන්ධනාගාරගත කළ නොහැක

නඩුව විභාග වන තුරු රක්ෂණ බන්ධනාගාරයක රඳවා තබාගත හැක්කේ යෞවනයෙක් පමණකි. එසේ කළ හැක්කේ 15 (2) වගන්තියේ සඳහන් කර ඇති විශේෂ තත්වයන් යටතේ පමණකි.

15 (1) හා (2) වගන්ති

## ■ චෝදනාව පැහැදිලි කර දීම

ළමයකු හෝ යෞවනයකු උසාවිය වෙත ඉදිරිපත් කළ විට චෝදනාව අප්‍රමාදව ලිහිල් භාෂාවෙන් පැහැදිලි කර දිය යුතුය.

9 (1) වගන්තිය

## ■ සවන්දීම

උසාවිය දෙපාර්ශ්වයටම සවන් දී නඩුව තීන්දු කළ යුතුය.

9 (5) වගන්තිය

[1] අපරාධ නඩු විධාන සංග්‍රහයේ 1 උපලේඛනයෙහි දණ්ඩ නීති සංග්‍රහය යටතට ගැනෙන අපරාධ සම්බන්ධයෙන් ඇප දිය හැකි වැරදි හා ඇප දිය නොහැකි වැරදි වෙන් කොට දක්වයි. සිදු කර ඇති වරද වෙනත් නීතියක් යටතට ගැනෙන වරදක් නම් එය ඇප දිය හැකි වරදක්ද නැද්ද යන්න එම නීතියෙහි සඳහන් කර තිබෙනු ඇත.

## ■ දඬුවම් නියම කිරීමට පෙර විමසීම

ළමයකු හෝ යෞවනයකු වරද කර ඇති බව තීන්දු කිරීමෙන් පසු නියෝගයක් කිරීමට පෙර උසාවියට ළමයාගේ අතීත වාර්තා හා වර්තමාන තත්ත්වය සළකා බැලිය හැක.

10 (1) වගන්තිය

## ■ වරද කර ඇති බවට තීන්දු කිරීමෙන් පසු කළ හැකි නියෝග

ළමා උසාවියකට පහත සඳහන් නියෝග කළ හැකිය.

- ළමයාට හෝ යෞවනයාට අවවාද කොට මුදා හැරීම
- අවුරුද්දකට නොවැඩි කාලයක් ළමයා හෝ යෞවනයා යහපත් කල් ක්‍රියාවෙන් යුතුව තබා ගැනීමේ කොන්දේසිය මත ළමයාගේ හෝ යෞවනයාගේ **දෙමාපියන්ට, භාරකරුට හෝ ළඟම වැඩිහිටි ඥාතියෙකුට** ළමයා හෝ යෞවනයා භාරදීම.
- ළමයා සිය භාරයේ තබා ගැනීමට කැමති නෑයෙකු වන හෝ නොවන **සුදුසු පුද්ගලයෙකුට** භාරදීම
- අපරාධ නඩු විධාන සංග්‍රහයේ 306 වන වගන්තිය යටතේ ළමයා හෝ යෞවනයා කොන්දේසි පිට මුදා හැරීම
- ළමයා හෝ යෞවනයා පරිවාස නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ තැබීම
- වරද සිදු කළේ වැඩිහිටියකු නම් සිර දඬුවමක් පැනවිය හැකි අවස්ථාවන්හීදී, උපරිම වශයෙන් මාසයක කාලයක් රැඳවුම් නිවාසයක ළමයා හෝ යෞවනයා රඳවා තබන ලෙස නියම කිරීම හෝ ඔහුගේ හෝ ඇයගේ වයස අවු. 12 ට වැඩි නම් අනුමත කළ හෝ සහතික කළ පාසලකට යැවීමට නියම කිරීම

  25 (1), 26 (1), 27 (1) හා 30 වගන්ති

## ■ ළමයකු බන්ධනාගාර ගත කළ නොහැකිය

අපරාධයක් සිදුකිරීම හෝ දඩයක් නොගෙවීම නිසා කිසිම ළමයකුට සිර දඬුවම් නියම කළ නොහැකිය. යෞවනයකුටද අපරාධයක් සිදු කිරීම හෝ දඩයක් නොගෙවීම හේතුවෙන් සිර දඬුවම් නියම කළ නොහැකි අතර එසේ කළ හැක්කේ ඔහු හෝ ඇය අතිශයින් දඩබ්බර පුද්ගලයකු බවට සහතික කරන්නේ නම් පමණි.

23 (1) හා (2) වගන්ති

## ■ වරදක් කර ඇති බවට තීන්දු කිරීම නුසුදුසු කමක් නොවේ

ළමා උසාවියක් විසින් වරදකරු කිරීම හෝ වරදක් කර ඇති බවට තීන්දු කිරීම ළමයකු හෝ යෞවනයකු සම්බන්ධයෙන් නුසුදුසු කමක් ලෙස නොසැලකිය යුතුය.

22 වගන්තිය

# භාරය හා ආරක්ෂාව

## ■ භාරය හා ආරක්ෂාව අවශ්‍ය ළමයෙක් හෝ යෞවනයෙක් වන්නේ කවුරුන්ද?

ඔහු දෙමාපියන් හෝ භාරකරුවන් නොමැති පුද්ගලයෙකි,

නැතහොත්, දෙමාපියන් හෝ භාරකරු භාරය හා ආරක්ෂාව දැරීමට නුසුදුසු වන්නා වූ හෝ නිසි භාරය හා ආරක්ෂාව නොසලසන්නා වුත් ඒ හේතුවෙන් නරක පුද්ගලයින්ගේ ඇසුරට වැටෙන්නා වූ හෝ සදාචාරාත්මක වශයෙන් අවදානමකට මුහුණපා සිටින්නා වූ හෝ හික්මවිය නොහැකි හෝ පුද්ගලයෙකි.

එසේම පුළුල් අර්ථයෙන් ගත් කල, ශාරීරික හිංසනය හා සම්බන්ධ අපරාධයකට ගොදුරු වූ ළමයෙක් හෝ යෞවනයෙක්ද එවැනි අපරාධයක් සිදු කළ පුද්ගලයා හෝ ඊට ගොදුරු වූ පුද්ගලයා සිටින එම පවුල තුළම ජීවත් වන්නා වූ ළමයෙක් හෝ යෞවනයෙක්ද, එම ළමයාට හෝ යෞවනයාට **භාරය හා ආරක්ෂාව අවශ්‍ය වන්නේ නම්** පමණක් මෙම ගණයට ඇතුළත් වේ.
**34 (1) වගන්තිය**

## ■ ආරක්ෂිත ස්ථාන[2]

ළමා හා යෞවන ආඥා පනත යටතේ ආරක්ෂිත ස්ථාන 3කි. එනම්,

- රැඳවුම් නිවාසයක්
- කවර හෝ රෝහලක්
- පනතේ 14 (3) වගන්තිය යටතේ ඇමතිවරයා විසින් නම් කර ඇති වගකිව යුතු පුද්ගලයකුගේ වාසස්ථානයක්

උප පොලිස් පරීක්ෂකවරයකුට හෝ ඊට ඉහළ නිලයක පොලිස් නිලධාරියකුට ළමයකු උසාවියට ගෙන යන තුරු කෙළින්ම එවැනි ආරක්ෂිත ස්ථානයකට ගෙන ගොස් තැබිය හැකිය. එසේම ළමයකුට හෝ යෞවනයෙකුට කෙළින්ම එවැනි ආරක්ෂිත ස්ථානයක පිහිට පැතිය හැකිය.

එසේම උසාවියටද ළමයා සම්බන්ධයෙන් අවසාන නියෝගයක් කරන තුරු වරකට ළමයා ආරක්ෂිත ස්ථානයක හෝ සුදුසු පුද්ගලයෙකුගේ භාරයේ ළමයා රඳවා තබන ලෙස අතුරු නියෝගයක් කළ හැකිය. එවැනි අතුරු නියෝගයක් දින 28ක කාලයකට සීමා කළ යුතුය.
**88 හා 37(1) වගන්ති**

[2] 1998 අංක 28 දරණ පනත මගින් සංශෝධිත අපරාධ නඩු විධාන සංග්‍රහයේ 451 අ වගන්තිය යටතේ අධිචෝදනා පත්‍රය හෝ චෝදනාව ගොනු කිරීමෙන් පසු, අපයෝජනයට ගොදුරු වූ ළමයාට භාරය හෝ ආරක්ෂාව අවශ්‍ය යැයි පෙනී යන අවස්ථාවන්හීදී වයස අවු. 18 කට අඩු ළමයකු ආරක්ෂිත ස්ථානයක රඳවා තැබීමට මහාධිකරණයට හෝ මහේස්ත්‍රාත් අධිකරණයට බලය ලබාදී ඇත. එවැනි නියෝගයක් කළ හැක්කේ ළමයාට භාරය හෝ ආරක්ෂාව අවශ්‍ය යැයි අධිකරණය සෑහීමකට පත් වුවහොත් පමණි.

■ භාරය හා ආරක්ෂාව පිළිබඳ නඩු වලදී උසාවියට කළ හැකි නියෝග

ළමයාට හෝ යෞවනයාට භාරය හෝ ආරක්ෂාව අවශ්‍ය බවට උසාවිය සෑහීමකට පත් විය යුතුය. නඩු තීන්දු අනුව එවැනි නියෝගයක් කිරීමට පෙර දෙමව්පියන්ට හෝ භාරකරුට සවන් දිය යුතු අතර උසාවිය පරිවාස නිලධාරියාගේ නිර්දේශය ඒ ආකාරයටම පිළිගැනීමට බැඳී නොමැත. කරුණු පිළිබඳව සෑහීමකට පත් වු පසු, උසාවියට පහත සඳහන් නියෝගයන් කළ හැකිය.

(අ) වයස අවු. 12ට වැඩි ළමයකු නම් සහතික කළ පාසලකට හෝ අනුමත කළ පාසලකට යැවීම, හෝ

(ආ) ළමයා භාරගැනීමට කැමති ළමයාගේ ඥාතියකු වන හෝ නොවන සුදුසු පුද්ගලයකුගේ භාරය යටතේ ළමයා තැබීම, හෝ

(ඇ) නිසි භාරය පවත්වා ගැනීමේ පොරොන්දුව මත ළමයා ඔහුගේ දෙමව්පියන්ට හෝ භාරකරුට භාරදීම, හෝ

(ඈ) උපරිම වශයෙන් අවු. 3ක කාලයකට ළමයා පරිවාස නිලධාරියකුගේ අධීක්ෂණයට යටත් කළ හැකිය.

(ඈ) ඡේදය යටතේ අදීක්ෂණ නියෝගයක් (ආ) සහ (ඇ) ඡේද යටතේ නියෝග සමග නිකුත් කල හැක.
**35 (1) වගන්තිය**

■ සහතික කළ හෝ අනුමත කළ පාසල් නියෝගයකට අදාළ කොන්දේසි

ළමයාගේ ආගමට අයත් සහතික කළ පාසලක් හෝ අනුමත කළ පාසලක් තෝරා ගැනීමට උසාවිය සැලකිලිමත් විය යුතුය.
**39 වගන්තිය**

අනුමත කළ පාසලක හෝ සහතික කළ පාසලක රැඳවීමේ නියෝගය අවු. 3ක කාලයක් ළමයා රඳවා තබාගැනීමට අවසර දෙයි. නියෝගය අවසානයේදී ළමයාගේ වයස අවු. 14ට අඩු වන්නේ නම් වයස අවු. 14 වන තුරු ඔහු හෝ ඇය පාසලේ රඳවා තබා ගත හැකිය.
**42 (1) වගන්තිය හා 43-45 වගන්ති ද බලන්න**

■ ළමයා හෝ යෞවනයා පිළිබඳ වාර්තාව

උසාවිය ළමයා සහතික කළ හෝ අනුමත කළ පාසලකට යවන විට ළමයාගේ තොරතුරු අඩංගු වාර්තාවක් පාසලේ කළමනාකරු වෙත යැවිය යුතුය.
**43 (2) වගන්තිය**

■ සුදුසු පුද්ගල නියෝගයට අදාළ කොන්දේසි

සුදුසු පුද්ගල නියෝගයක් ළමයාට අවු. 16 වනතුරු බල පවත්වයි.
ළමයාගේ භාරය පවරන පුද්ගලයාද ළමයාගේ ආගමට අයත් විය යුතුය. නැතහොත් ළමයාගේ ආගමට අනුව ඒ ළමයා හදා වඩා ගන්නා බවට එකඟ විය යුතුය.

සුදුසු පුද්ගලයකුට ළමයාගේ දෙමාපියන්ට හෝ භාරකරුට සාමාන්‍යයෙන් හිමි අයිතිවාසිකම්, බලතල හා වගකීම් ඇත.
**46 වගන්තිය**

කිසියම් පුද්ගලයකුගේ ඉල්ලීම මත ළමයකු සුදුසු පුද්ගලයකුගේ භාරය යටතේ තැබීමේ නියෝගයක් වෙනස් කරනු හෝ අවලංගු කරනු ලැබිය හැකිය.

ළමයාගේ හෝ එම පුද්ගලයාගේ ඉල්ලීම මත ළමයකු සුදුසු පුද්ගලයකුගේ භාරය යටතේ තැබීමේ නියෝගයක් සංශෝධනය කිරීමට හැකිය.
**57 (4) වගන්තිය**

## ළමයාගේ හෝ යෞවනයාගේ වයස තීරණය කිරීම

ළමයාගේ හෝ යෞවනයාගේ උප්පැන්න සහතිකය නොමැති අවස්ථාවලදී ළමයාගේ වයස තීරණය කිරීම පිණිස වෛද්‍ය වාර්තාවක් කැඳවීම ඇතුළු සාක්ෂි කැඳවීමට උසාවියට හැකිය. එසේ තීරණය කරන වයස ළමයාගේ හෝ යෞවනයාගේ සැබෑ වයස බවට පූර්ව නිගමනයක් වන අතර ළමයාගේ වයස ඊට වෙනස් බවට පසුව පෙනී ගියද ඒ නිසා නඩු කටයුතු අවලංගු නොවේ.
**80 වගන්තිය**

## චූදිතයාගේ බිරිඳගේ හෝ සැමියාගේ සාක්ෂි

ළමයාට හෝ යෞවනයාට අපරාධය සිදු කර ඇති චූදිත දෙමව්පියන් ගෙන් කෙනෙකු නම්, දෙමාපියන්ගෙන් අනික් පුද්ගලයා පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි දීමට කැඳවනු ලැබිය හැකිය.
**81 වගන්තිය**

## අභියාචනා සහ පරිශෝධන ඉල්ලීම්

ළමයකු හෝ යෞවනයකු සම්බන්ධයෙන් කරනු ලබන මතු දැක්වෙන නියෝගයකට එනම්,

- සුදුසු පුද්ගලයකුගේ රැකවරණය යටතේ තැබීමේ නියෝගයකට
- රැඳවුම් නිවාසයක රඳවා තැබීමේ නියෝගයකට
- සහතික කළ පාසලකට හේ අනුමත කළ පාසලකට යැවීමේ නියෝගයකට
- පරිවාස නිලධාරියකුගේ හෝ සුදුසු පුද්ගලයකුගේ අධීක්ෂණය යටතේ තැබීමේ නියෝගයකට

එරෙහිව ළමයා හෝ යෞවනයා විසින් හෝ දෙමව්පියන් හෝ භාරකරු විසින් පළාත් බද මහාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය.

වෙනත් නියෝගයන්ට එරෙහිව පළාත් බද මහාධිකරණය වෙත ප්‍රතිශෝධන ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකිය.
**84 වගන්තිය**

# ළමා හා යෞවන ආඥා පනතට අදාළ නඩු තීන්දු

**නවරත්නම් එදිරිව කරුණාරත්න 62 NLR 82**

ළමා හා යෞවන ආඥා පනතේ 35 (1) වගන්තිය යටතේ ළමා උසාවියක් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබූ විට, සාක්ෂි විමසා බලා භාරය හා ආරක්ෂාව අවශ්‍ය බවට පෞද්ගලිකවම සෑහීමට පත්වීම මහේස්ත්‍රාත්වරයාගේ වගකීම වන්නේය. **පරිවාස නිලධාරියාගේ වාර්තාව මතම පිහිටා කටයුතු කිරීමට මහේස්ත්‍රාත්වරයාට නොහැකිය.**

**පෙරිම්බරාජා එදිරිව ස්ථානාධිපති, සුළු පැමිණිලි අංශය (වත්තල) 1994(2) SLR 361**

මෙම නඩුවට අදාළ ළමයා 13 හැවිරිදි ගෘහ සේවකයෙකි. කිසිදු විමසීමක් කිරීමෙන් තොරව පරිවාස වාර්තාව සලකා මහේස්ත්‍රාත්වරයා ළමයා තුන් වසරක කාලයක් සඳහා මග්ගොන සහතික කළ පාසල වෙත යැවීමට තීරණය කළේය.

**අභියාචනා අධිකරණය මෙසේ තීන්දු කළේය.**

1. අධ්‍යාපන ආඥා පනතේ 43 වගන්තියට අනුව වයස අවු. 14 සපිරෙන තුරු ළමයා පාසලට යවන බවට වගබලා ගැනීම දෙමාපියන්ගේ වගකීමකි.

2. ඉකුත් වසර 7 පුරා ළමයා පාසල් යවා නැති නමුදු දෙමාපියන්ට විරුද්ධව නඩු පැවරීමට කටයුතු කර නොතිබුණි.

3. ළමයාගේ දෙමව්පියන් ළමයා රැක බලාගැනීමට හැකි තත්වයක සිටීද යන්න පිළිබඳ ඔවුන්ගෙන් විමසා බලා දැන ගැනීමේ වගකීමක් මහේස්ත්‍රාත්වරයාට තිබුණේය. ළමයා කිසිදු වරදක් සිදු කර නොතිබුණි, ළමයා නරක ඇසුරක යෙදී ඇති බවට හෝ සදාචාරාත්මක අවදානමකට මුහුණ පා ඇති බවට හෝ ඔහු පාලනය කළ නොහැකි පුද්ගලයකු බවට හෝ සාක්ෂි කිසිවක් නොතිබිණි. දෙමාපියන් ළමයාගේ භාරය හා ආරක්ෂාව දැරීමට සුදුසු පුද්ගලයන්ද යන්න හෝ ළමයා සම්බන්ධයෙන් නිසි භාරයක් හා රැකවරණයක් නොපවත්වන්නේ ද යන්න සොයා බලා තීරණය කිරීම මහේස්ත්‍රාත්වරයාගේ වගකීමකි. මෙය ස්වභාවික යුක්තිය පිළිබඳ නීතිය උල්ලංඝණය කිරීමකි. (ස්වභාවික යුක්තිය පිළිබඳ මූලධර්මය අනුව දෙපාර්ශවයටම සවන් දිය යුතුය.)

4. පනතේ 35 (1) (ඇ) වගන්තිය යටතේ ක්‍රියාකරන ලෙසත්, නිසි භාරය හා ආරක්ෂාව පවත්වා ගන්නා බවට බැඳුම්කරයකට එළඹෙන ලෙස ළමයාගේ දෙමාපියන්ට නියෝග කරන ලෙසත් මහේස්ත්‍රාත්වරයාට නියම කරන ලදී.

## සටහන්

මෙම නඩු තීන්දු වල සම්පිණ්ඩනය නම්: මහේස්ත්‍රාත්වරයා පූර්ණ විමර්ශනයක් සිදුකොට අවශ්‍ය නම් පාර්ශවයන්ගේ වාචික සාක්ෂි ගැනීම සිදු කළ යුතුය. ළමයාගේ කැමැත්ත නිසි ලෙස දැන ගෙන එය සැළකිල්ලට ගැනීම අවශ්‍ය බව අද පොදු පිළිගැනීම වී තිබේ. දෙවන නඩුව මෙම පුළුල් මූලධර්මය නිශ්චිතව යොදාගත් අවස්ථාවක් වන අතර ළමයාගේ දෙමාපියන්ට කරුණු දැක්වීමේ අයිතියක් ඇති බවට එය තීන්දු කළේය.

ළමයා සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට මත්තෙන් නිසි කාර්යපටිපාටිය අනුගමනය කිරීම තීරණාත්මක වැදගත් කමකින් යුක්ත වේ. පනතේ 17 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සමාජ වාර්තාව තීරණාත්මක නොවන නමුදු තීරණයකට එළඹීම සඳහා උපයෝගී කර ගත යුතු ප්‍රධාන ලේඛණය වේ.

## රජු එදිරිව ඩබ්ලිව්.ජයසේන නොහොත් ජයසිංහ **43 CLW 71**

### ශ්‍රේෂන් විනිසුරුතුමා

අවුරුදු 16 කුත් මාස 6ක් වයසැති පිරිමි ළමයකුට එරෙහිව මිනී මැරීම පිළිබඳ චෝදනා නගා තිබුණි. චෝදනාව ඔප්පු කිරීමට සාක්ෂි නොතිබුණ නමුදු ළමයා දණ්ඩ නීති සංග්‍රහයේ 333 වගන්තිය යටතේ සාවද්‍ය ලෙස රඳවා තබා ගැනීම පිළිබඳ වරද සම්බන්ධයෙන් වරද පිළිගත්තේය. නඩුවේ ඉදිරිපත් වු වෛද්‍ය හා වෙනත් සාක්ෂි අනුව, ළමයා බුද්ධිමත්, සහයෝගශීලී, විනයට නතු යහපත් පුරවැසියකු බවට හැඩ ගස්වනු ලැබීමේ හැකියාවෙන් යුත් බව පෙනී ගියේය.

ළමා හා යෞවන ආඥා පනතේ 21 වන වගන්තියට යටින් දිවෙන මූලධර්මය වන්නා වූ වුදිතගේ හා සමාජයේ උපරිම යහපත උදෙසාද, ආඥා පනතේ පරමාර්ථයන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් යාන්ත්‍රණයක් නොමැති වීම නිසා ද මෙම නඩුවේ තත්ත්වයන් අනුව අපරාධ නඩු විධාන සංග්‍රහයේ 325(2) හා 325(2ඊ) වගන්ති යටතේ කොන්දේසි වලට යටත්ව ළමා වුදිතයා මුදා හැරිය යුතුය යන්න අධිකරණයේ මතය විය.

## ජෝන් මැතිව් නඩුව **1986** (1) SLR 243

යෞවනයකු රැඳවුම් නිවාසයක හෝ සහතික කළ පාසලක රඳවා තැබිය නොහැකි දඩබ්බර චරිතයකින් යුත් පුද්ගලයකු වන්නේ යැයි කියා හෝ ඔහු එසේ රඳවා තැබීමට නුසුදුසු පහත් චරිතයකින් යුක්ත පුද්ගලයකු යැයි කියා හෝ උසාවිය සහතික කරනු නොලබන්නේ නම් යෞවනයකුට කිසියම් වරදක් සම්බන්ධයෙන් සිර දඬුවම් පැමිණ වීම හෝ දඩයක් නොගෙවීම සම්බන්ධයෙන් ඔහු බන්ධනාගාර ගත කිරීම නොකළ යුතුය.

## අතුරුපාන නඩුව 51 NLR 21

### ග්‍රේෂන් විනිසුරුතුමා

අපරාධ නඩු විධාන සංග්‍රහයේ 289(2) වගන්තියේ නියම කර ඇති කාලසීමාව නොඉක්ම වන කාල පරිච්ඡේදයක් සඳහා වුදිතයකු රක්ෂණ බන්ධනාගාර ගත කර ඇති විට, විමසීම හෝ නඩු විභාගය කල් දැමීමට සිදු වන්නේ නම් කළ යුතු උචිත නියෝගය කුමක්ද යන්න පිළිබඳව නැවත වරක් මනස යොමු කිරීමට මහේස්ත්‍රාත්තුමාට හැකිවන පරිදි, එම වකවානුව අවසානයේදී වුදිතයා අධිකරණයට ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය වේ. ඇප නියම කිරීමේදී අධිකරණයේ අභිමතය පාවිච්චි කිරීමත් අදාල නඩුවේ පවතින තත්ත්වය අනුව ඉහළින්ම සැළකිලිමත් විය යුතු දේ ගැන සැළකිලිමත් වීමත් අවශ්‍යය.

*යම් කිසි පුද්ගලයෙකු වඩාත් අසරණ වන්නේද එවැනි අවස්ථාවලදී මිනිසා විසින් සිදු කරන කුරිරුකම් වලින් බේරීමට මිනිසකුගේම ආරක්ෂාව ලැබීමට වඩාත් හිමිකම් ඇතැයි මම විශ්වාස කරමි. නමුත් එවැනි සේවයක් ලබාදීම සඳහා සුදුසුකම් නොමැති අයෙකුට කුමන ආරක්ෂාවක් හෝ ලබාදිය නොහැක.*

*- මහත්මා ගාන්ධි*

Save the Children
in Sri Lanka

unicef